## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

6 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය

නම : ..........................................................................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

### I කොටස

1) පාසලේ ඉතිහාසය යනු,

1. පාසල ආරම්භ වූ කාලයයි.
2. පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා කාලයයි.
3. පාසල ආරම්භ වූ දා සිට පාසල පවතින තුරු කාලයයි.
4. පාසලේ ඉහළ විභාග ප්‍රතිඵල පෙන්වූ කාලයයි.

2) පාසලක අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් වන්නේ,

1. කම්කරු  2. ගුරුවරු  3. ලිපිකරු  4. මුරකරු

3) පාසල් කොඩිය ඔසවන විට ප්‍රදර්ශනය කළ යුතු ඉරියව්වක් නොවන්නේ.

1. පාසල් ගීය ගායනා කිරීම.  2. පාසල් කොඩිය අභිමානයෙන් එසවීම.
3. පාසල් කොඩියට පිටුපා සීරුවෙන් සිටීම.  4. පාසල් කොඩියට මුහුණලා සීරුවෙන් සිටීම.

4) නිර්මිත පරිසරයට අයත් වනුයේ,

1. ඇළදොළ  2. උද්‍යාන  3. ගංගා, විල්  4. තුරුලතා

5) මහනගර සභාවක ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ.

1. නගරාධිපතිය.  2. සභාපතිය.  3. මහ ඇමතිය.  4. මන්ත්‍රීතුමාය.

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණද වැරදි නම් (o) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

6) පාසලක ශිෂ්‍ය ගුරු සංඛ්‍යාව අනුව සංවිධාන ව්‍යුහය වෙනස් විය නොහැක. (   )

7) ඔබේ දුර්වලතාවයන් හේතුවෙන් ඔබට බොහෝ අවාසි සිදුවිය හැක. (   )

8) එක් පාසලක් විවෘත කිරීම සිරගෙයක් වසා දැමීමට හේතුවනු ඇත. (   )

9) අප රටේ කුඩාම පරිපාලන ඒකකය වනුයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. (   )

10) තම බල ප්‍රදේශයේ මංමාවත් ඉදිකිරීම හා නඩත්තු කිරීම ප්‍රාදේශීය සභාවල කාර්යයකි. (   )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළදී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(ගුණාත්මකභාවය, නොමිලේ, අවශ්‍යතා, සැලැස්මක්, ගුරු ඔවදන්)

11) සෑම පුද්ගලයෙකුගේම ජීවිතේ සාර්ථකත්වය උදෙසා ................................................ අත්‍යවශ්‍ය වේ.

12) කුසලතා වලින් පිරිපුන් දරුවෙක් බිහිකිරීමට ............................................... මහඟු ලෙස උපකාරී වේ.

13) මානව සම්පතෙහි ......................................................... , පුහුණුව මඟින් වැඩි දියුණු කළ හැක.

14) ප්‍රදේශයෙහි ජනතාවගේ පොදු .................................................. ඉටුකර ගැනීම සඳහා සමිති සමාගම් ක්‍රියාත්මක වේ.

15) රජයේ රෝහල් වල සියලුම සේවාවන් ............................................... සපයයි.

අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

16) පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කුසලතාවයන් වැඩි දියුණු කිරීම .................................................. කමිටුව මගින් ඉටු කරයි.

17) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවක් ලෙස ඉවසිලිවන්ත බවින් කටයුතු කිරීම ඔබ සතු .................................................... කි.

18) පාසලකට පාසල් ගීතයක් තිබීම එම පාසලේ ........................................................ පිළිබිඹු කරන වැදගත් සංකේතයයි.

19) ග්‍රාම නිලධාරී කොට්ඨාස සමූහයක් එකතු වී ගොඩනැගෙන පරිපාලන ඒකකය .................................................. කොට්ඨාසයයි.

20) මිනිසා භෞතික පරිසරයට කරන අහිසි බලපෑම නිසා සම්පත් ........................................... කළ යුතු වේ.

(20 x 2 - 40)

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්යවේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

1) i) අප ප්‍රදේශයේ ඇති සමුපකාර සමිතියෙන් සිදුවන සේවා 2 ක් ලියන්න.

ii) ආගමික සිද්ධස්ථාන මගින් අපට ලැබෙන සේවාවන් 2 ක් සඳහන් කරන්න.

iii) රජය මගින් සහන මිල යටතේ ලබාදෙන සේවාවන් 2 ක් ලියා දක්වන්න.

iv) සාමූහිකව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 2 ක් සඳහන් කරන්න.

v) මිනිසාගේ පැවැත්මට හා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ඇති භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න.

vi) අප ජීවත්වන ප්‍රදේශයේ පරිපාලන ඒකක කොපමණ තිබේද? ඉන් එක් ඒකකයක් නම් කරන්න.

vii) පාසලක දියුණුව සඳහා දායකත්වය ලබාගත හැකි කණ්ඩායම් 2 ක් සඳහන් කරන්න.

viii) පාසල් දරුවකු ලෙස ඔබ ඇතිකරගත යුතු අරමුණු 2 ක් ලියන්න.

(2 x 8 - 16)

2) i) පාසල් සංවිධාන ව්‍යුහයේ දක්නට ලැබෙන භූමිකා 2 ක් සඳහන් කරන්න. (ල. 02)

ii) ඉන් එක් භූමිකාවක් තෝරාගෙන එහි වගකීම් 2 ක් හා යුතුකම් 2 ක් සඳහන් කරන්න. (ල. 04)

iii) පාසල තුළ ක්‍රියාත්මක වන්නාවූ සංවිධාන 2 ක් සඳහන් කර ඉන් එක් සංවිධානයක කාර්යභාර්යන් 3 ක් ලියා දක්වන්න. (ල. 05)

3) i) පාසල් දරුවකු ලෙස ඔබට ඔබ නිවැරදිව හඳුනාගැනීමට උපකාරී වන කරුණු 2 ක් සඳහන් කරන්න.

(ල. 02)

ii) පාසල් සිසුවකු සිසුවියක ලෙස ජීවිතයේ සාර්ථකත්වය උදෙසා ඇති කරගත යුතු යහපත් අරමුණු 4 ක් ලියන්න. (ල. 04)

iii) A හා B යන රූප දෙකෙහි දැක්වෙන පුද්ගලයින් පිළිවෙළින් නම් කර ඔවුන්ගේ දක්ෂතා තුළින් රටට ඉටුකළ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)



A



B

4) i) සැලසුම්කරණය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

ii) සැලසුම්සහගත නොවූ ශිෂ්‍යයෙකුගේ ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ල. 04)

iii) ඔබ විසින් වාර විභාගයට සාර්ථකව මුහුණදීම සඳහා අවශ්‍ය වන කාලසටහනක් සැලසුම් කර ලියා දක්වන්න. (ල. 05)

5) i) පාසල් සමාජයේ සාමාජික සාමාජිකාවක් ලෙස ඔබ සතු අයිතිවාසිකම් 2 ක් සඳහන් කරන්න. (ල. 02)

ii) ඔබට සිප්සත ලබාදෙන ගුරුවරු වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 2 ක් සහ ගුරුවරු ගුරුවරියන් විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් 2 ක් ලියන්න. (ල. 04)

iii) ළමා මිතුරු පාසල් යනු කුමක්ද?
එවැනි පාසල් පරිසරයක දක්නට ලැබෙන ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ල. 05)

6) i) ශ්‍රී ලංකාවට අයත් පළාත් ගණන කීයද? ඉන් පළාත් 2 ක් නම් කරන්න. (ල. 02)

ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන පරිපාලන ඒකක අතර ඇති වෙනස්කම් කෙටියෙන් ලියන්න. (ල. 04)

iii) පරිපාලන ඒකක ඇසුරින් ඔබ ප්‍රදේශයේ පිහිටීම නිවැරදිව ලියා දක්වන්න. (ල. 05)

7) i) ස්වභාවික සම්පතක් වන ජලය ආරක්ෂා කරගන්නා ආකාර 2 ක් ලියන්න. (ල. 02)

ii) මානව සම්පත විධිමත් ලෙස පුහුණු කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල. 04)

iii) විශේෂ පුහුණුව ලද මානව සම්පත් 5 ක් ලියන්න. (ල. 05)